## XIII වන පරිච්ඡේදය

## නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර සහ අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර

1. රාජකාරී සඳහා
2. නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම
3. නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් ප්‍රවේශ පත්‍රයකට හුවමාරු කර ගැනීම
4. භාවිතා නොකළ නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර සහ ප්‍රවේශ පත්‍ර
5. බිල්පත් පරීක්ෂා කිරීම සහ නිරවුල් කිරීම
6. නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර
7. වර්ෂිකව ලබා ගත හැකි නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර ප්‍රමාණය
8. නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර මගින් ගමන් කළ හැකි පංතිය
9. පවුල්
10. නිවාඩු දුම්රිය බලපත්‍ර සඳහා අයදුම් කිරීම
11. භාවිතා නොකළ බලපත්‍ර සහ ප්‍රවේශ පත්‍ර
12. දුම්රිය ගමන් බලපත්‍ර සහ ප්‍රවේශ පත්‍ර අවභාවිතා කිරීම
13. වාර්තා කිරීම සහ ගිණුම් ගත කිරීමේ ක්‍රමවේදය
14. අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍රය

## XIII වන පරිච්ඡේදය

## නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර සහ අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර

### 1. රාජකාරී සඳහා

1.1 තමන් හට පැවරී ඇති රාජකාරියක් ඉටු කිරීම සඳහා දුම්රියෙන් ගමන් කිරීමට අවශ්‍ය වූ විට, පහත සඳහන් තැනැත්තන් හට කොමිෂන් සභාව මඟින් නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාව මඟින් රාජකාරී සඳහා නිකුත් කරන දුම්රිය ගමන් බලපත්‍ර

(අ) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට, නොයෙකුත් මණ්ඩලවල සිටින තැනත්තන්, පනත මඟින් දක්වා ඇති විධිවිධාන පරිදි හෝ කොමිෂන් සභාව මඟින් පත් කළ කමිටුවල හෝ වෙනත් එවැනි සමුච්චයක සාමාජිකයින්

(ආ) කොමිෂන් සභාව මඟින්, ස්ථිර, තාවකාලික හෝ අනියම් පදනම මත සේවයට යොදවා ඇති තැනැත්තන්

(ඇ) යම් විශේෂිත කරුණක් වෙනුවෙන් කොමිෂන් සභාව විසින් ආරාධනය කරනු ලැබූ තැනැත්තන්

1.2 තමන් හට පැවරී ඇති රාජකාරියක් ඉටු කිරීම සඳහා දුම්රියෙන් ගමන් කිරීමට අවශ්‍ය වූ විට, පහත සඳහන් තැනැත්තන් හට උසස් අධ්‍යාපන ආයතනයක් / විද්‍යායතනයක් මගින් නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කරනු ලැබිය හැකි ය.

උසස් අධ්‍යාපන ආයතනයන් මඟින් රාජකාරී සඳහා නිකුත් කරන දුම්රිය ගමන් බලපත්‍ර

(අ) විශ්වවිද්‍යාලයක කුලපතිවරුන් සහ උපකුලපතිවරුන්

(ආ)විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි අධ්‍යක්ෂකවරුන්

(ඇ)මණ්ඩපයක මණ්ඩපාධිපතිවරුන්

(ඈ)උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක / මධ්‍යස්ථානයක අධ්‍යක්ෂකවරුන්

(ඉ)උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක “බල මණ්ඩලයක” සාමාජිකයන්

(ඊ)පනතෙහි දක්වා ඇති විධිවිධාන මත හෝ උසස් අධ්‍යාපන ආයතනයන්හි / විද්‍යායතනයෙහි බල මණ්ඩලයක හෝ වෙනත් සමාන සමුච්චයක තැනැත්තන්

(උ)ස්ථිර, තාවකාලික සහ අනියම් පදනම මත උසස් අධ්‍යාපන ආයතනය විසින් සේවයට යොදවා ඇති තැනැත්තන්

(ඌ)උපකුලපතිවරුන්, විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරුන්, මණ්ඩපයක මණ්ඩපාධිපතිවරුන්, උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනයක/ මධ්‍යස්ථානයක අධ්‍යක්ෂකවරුන් විසින් යම් විශේෂිත කරුණක් සඳහා ආරාධනා කරනු ලැබූ තැනැත්තන්,

1.3 දුම්රියෙන් ගමන් කිරීම සඳහා, නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයෙහි නියම කළ යුතු පංතිය වන්නේ,

ගමන් කළ යුතු පංතිය

(අ) පළමුවෙනි පංතිය

පළමු පංතිය

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන්; පනත මඟින් නියමකොට ඇති පරිදි හෝ කොමිෂන්

සභාව මඟින් යම් මණ්ඩලයකට කමිටුවකට අයත් තැනැත්තන්

(ii) විශ්වවිද්‍යාලයන්හි කුලපතිවරුන් සහ උපකුලපතිවරුවන්; මණ්ඩපවල මණ්ඩපාධිපතිවරුන්, විශ්වවිද්‍යාල විද්‍යායතනයක, උසස් අධ්‍යාපන ආයතනයක හෝ මධ්‍යස්ථානයක අධ්‍යක්ෂකවරුන්; උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක "බල මණ්ඩලයක" සාමාජිකයන්, පනතෙහි විධිවිධානයන්ට අනුව හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක බලමණ්ඩලයක් මඟින් මණ්ඩලයකට, කමිටුවකට පත් කරන ලද සාමාජිකයින්

(iii) කොමිෂන් සභාව මඟින් නිගමනය කරනු ලබන වැටුපක් ලබන, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවය කරන තැනැත්තන්.

(ආ) ඉහත 1.1 සහ 1.2 උපඡේදයන්ට අනුව යම් විශේෂිත කරුණු වලට අදාලව ආරාධනා කරනු ලැබූ තැනැත්තන් හට, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ / විශ්වවිද්‍යාල උපකුලපතිවරයාගේ / මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයාගේ / උසස් අධ්‍යාපන පිළිබඳ ආයතනයක/මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයාගේ අභිමතය පරිදි, පළමු වැනි පංතියේ හෝ දෙවන පංතියේ නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කළ හැකිය. — ආරාධනා කරනු ලැබුවන්

(ඇ ) කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලබන යම් වැටුපක් ලබන කොමිෂන් සභාවේ / උසස් ආයතනයක ආයතනයක / විද්‍යායතනයක සේවකයින් සඳහා දෙවන පංතියේ නිදහස් දුම්රිය ගමන් බලපත්‍රය ලබාදිය හැකි ය. — දෙවන පංතිය

(ඈ) මෙම ඡේදයෙහි පළමු වැනි හෝ දෙවැනි පංතියේ නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර සඳහා සුදුසුකම් නො ලබන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන් හට තුන්වන පංතියේ නිදහස් දුම්රිය ගමන් බලපත්‍රය ලබාදිය හැකි ය. — තුන්වන පංතිය

1.4 කොමිෂන් සභාව මඟින් සහ උසස් අධ්‍යාපන ආයතනයක් මඟින් සේවයට යොදවා සිටින, නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර සඳහා හිමිකම් ඇති (මෙම පරිච්ඡේදයෙහි 4 සිට 10 දක්වා වූ ඡේදයන් බලන්න) සේවකයකු සඳහා ඔවුන්ගේ නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර හිමිකම එම අදාල උසස් අධ්‍යාපන ආයතනය මඟින් නිකුත් කළ යුතු වේ. — නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රය

1.5 මෙම ඡේදයෙහි සඳහන් ගමන් කිරීමට නියමිත පංතිය, රාජකාරී සහ නිවාඩු ගමන් සහ දෙවර්ගයටම අදාල වේ. — රාජකාරී සහ නිවාඩු යන දෙවර්ගයටම අදාල ය

1.5.1 ගමන් කිරීමට නියමිත පංතියකට අදාලවන වැටුප කොමිෂන් සභාව මඟින් නිගමනය කරන පරිදි විය යුතු ය. — ගමන් කරන පංතියට අදාල වැටුප්

1.5.2 දුම්රිය ගමන් බල පත්‍රයක් නිකුත් කරන විට, එම තැනැත්තා තමන්ට හිමි පංතියට වඩා අඩු පංතියක ගමනේ යෙදීමට තෝරාගන්නේ නම්, ඔහුට එම අඩු පංතියේ දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් කළ හැකි ය. — අඩු පංතියක ගමන් කිරීම

1.5.3 පළමු වැනි පංතියේ හෝ දෙවන පංතියේ නිදහස් දුම්රිය ගමන් බල පත්‍රයක් හිමි තැනැත්තෙකු හට, නිදන මැදිරියක හෝ නිදන ආසනයක ගමන් කිරීමට, ( එවැනි පහසුකම්, ගමන් ගන්නා දුම්රියේ සලසා තිබේ නම්) හිමිකම් ඇත. එමෙන්ම පළමු වැනි පංතියේ නිදහස් දුම්රිය ගමන් බල පත්‍රයක් හිමි තැනැත්තකු හට නිරීක්ෂණ මැදිරියක හෝ වායුසමනය කළ මැදිරියක ගමන් කිරීම සඳහා හිමිකම් තිබේ. එම අවස්ථාවල දී අදාල තැනැත්තාගේ ඉල්ලීමක් නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයට ඇතුලත් කරනු ඇත. — විශේෂ ගමන් පහසුකම්

1.6 කොමිෂන් සභාවක හෝ උසස් අධ්‍යාපන ආයතනයක භාණ්ඩ දුම්රිය ගමන් මඟින් ප්‍රවාහනය කිරීමට අවශ්‍ය වූ විට හෝ කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තකු හට ස්ථාන මාරුවීමක් ලැබීමෙන් අනතුරුව හෝ රාජකාරී කටයුත්තක් සඳහා ගමන් කරන විට මෙන්ම ඒ හේතුවෙන් බඩු බාහිරාදිය, ගෘහ භාණ්ඩ සහ වෙනත් භාණ්ඩ දුම්රියෙන් ප්‍රවාහනය කිරීමට අවශ්‍ය වූ විට, නිදහස් දුම්රිය බලපත්‍රයක් නිකුත් කළ හැකි ය. — භාණ්ඩ ප්‍රවාහනය

1.6.1 භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ දී, එම භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ අවශ්‍යතාවය මත භාණ්ඩ ප්‍රවාහන දුම්රිය බලපත්‍ර නිකුත් කරනු ඇත. — භාණ්ඩ ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීම

1.6.2 කොමිෂන් සභාවේ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තකු විසින් තමන් ස්ථාන මාරුවීමක් හේතුවෙන් වෙනත් සේවා ස්ථානයක් වෙත යාමේදී ප්‍රවාහනය කිරීමට අවසර ලැබී ඇති උපරිම ගෘහ භාණ්ඩ සහ වෙනත් බඩු බාහිරාදියෙහි බර ප්‍රමාණය දැනට බලපවත්නා ප්‍රවාහන රෙගුලාසි වලට අනුව නිගමනය කළ යුතුවේ. — ස්ථාන මාරුවීමකදි ප්‍රවාහනයකළහැකි උපරිම භාණ්ඩ ප්‍රවාහනයේ බර

1.7 යම් ලියාපදිංචි වෘත්තීය සමිතියක සාමාජිකයින් හට වාර්ෂිකව, එම වෘත්තීය සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වීම පිණිස, එකී රැස්වීම පැවැත්වෙන ස්ථානයට නුදුරින් පිහිටි දුම්රිය ස්ථානය වෙත ගමන් කිරීම සඳහා එක් නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර යුගලයක් ( යාමට සහ ඒමට ) සේවයේ අවශ්‍යතාවයන්ට යටත්ව නිකුත්කල හැකි ය. මෙම නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම, කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් / විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා විසින් / විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයා විසින් / උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනක / මධ්‍යස්ථානයක ජ්‍යෙෂ්ඨතම පරිපාලන නිලධරයා විසින් සිදුකරනු ඇත. — වෘත්තීය සාමාජිකයන් සඳහා

1.8 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක නිලධාරයකු වෙනුවෙන් විනය පරීක්ෂණයක දී පෙනී සිටින විශ්වවිද්‍යාල සේවයේ හෝ රාජ්‍ය සේවයේ නිලධරයෙකු හට රාජකාරී දුම්රිය ගමන් බල පත්‍රයක් සහ ප්‍රවාහන වියදම් ලබා ගැනිමට හිමිකම තිබේ. — විනය පරීක්ෂණ සඳහා පෙනී සිටින නිලධාරීන්

## 2. නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම

2.1 නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර පහත සඳහන් නිලධාරීන් විසින් අත්සන් කොට නිකුත් කරනු ලබයි. — නිකුත් කරන බලධාරීන්

2.1.1 කොමිෂන් සභාව; ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් නම් කරන ලද පරිපාලන නිලධරයකු විසින් — කොමිෂන් සභාව

2.1.2 විශ්වවිද්‍යාලය; ලේඛකාධිකාරීවරයා විසින් හෝ ඔහු විසින් නම් කරන ලද පරිපාලන නිලධරයකු/ නිලධරීන් විසින් — උසස් අධ්‍යාපන ආයතන

2.1.3 විශ්වවිද්‍යාල විද්‍යායතනය; ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් නම් කරන පරිපාලන නිලධරයකු / නිලධාරීන් විසින්

2.1.4 මණ්ඩපය; මණ්ඩපාධිතිවරයා විසින් හෝ ඔහු විසින් නම් කරනු ලබන පරිපාලන කාර්ය මණ්ඩලයේ නිලධරයකු විසින්

2.1.5 උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනයන් / මධ්‍යස්ථානයන්; අධ්‍යක්ෂකවරයා හෝ ඔහු විසින් නම් කරන ලද පරිපාලන කාර්ය මණ්ඩලයේ නිලධරයකු විසින්

2.2 නිදහස් දුම්රිය ගමන් බල පත්‍රයක් නිකුත් කිරීමට පෙර එම ගමන් බල පත්‍රය නිකුත් කරනුයේ ඉහත 1.1, 1.2, 1.4 සහ 1.6 උපඡේදයන්හි සඳහන් කරුණු සම්බන්ධයෙන් ද යන්න ගැන එම බලපත්‍රය නිකුත් කරන බලධාරීන් සෑහීමට පත්විය යුතු ය. — අනුමත ගමන් සඳහන් පමණකි

2.3 ඉහත 2.2 උපඡේදයෙහි සඳහන් කරුණකට පරිබාහිරව, වෙනත් විශේෂිත කරුණක් අරබයා, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක, විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ යම් තැනැත්තකු හට නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමට බලය ලබා දුන් අවස්ථාවක දී, එම බලපත්‍රයට අත්සන් කොට නිකුත් කරන නිලධාරියා විසින්, එවැනි නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමට හේතු වූ කරුණු සහ සභාපතිවරයාගේ / ප්‍රධාන විධායක නිලධාරීන්ගේ නියෝග අඩංගු ලේඛන ද ඉහල නිලධාරීන්ගේ සහ විගණක නිලධාරීන්ගේ පරීක්ෂාව සඳහා අවශ්‍ය වූ විට ඉදිරිපත් කිරීම සඳහා සුරැකිව ගොනු කොට තැබිය යුතු ය. — විශේෂිත අවස්ථාවන්හි දී බලපත්‍ර නිකුත් කිරීම

2.4 තනි ගමනක් සඳහා වෙනම නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් කළ යුතු ය. තනි ගමනක් සඳහා නිකුත් කළ දුම්රිය ගමන් බලපත්‍රයක් උපයෝගී කරගනිමින් ගමන් දෙකක් සඳහා, එනම් ඉතිරි ගමනට මුදල් ගෙවා ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීමට අවසර නොමැත. — එක් එක් ගමන සඳහා වෙනම බලපත්‍ර

2.5 නිකුත් කරන කාර්යාලය සහ දිනය, ගමනේ යෙදීමට බලාපොරොත්තු වන දිනය, නිකුත් කරන්නේ කුමන කරුණක් උදෙසා ද, බලපත්‍රය පාවිච්චි කිරීමට නියමිත අයවළුන්ගේ නම / නම් සහ ඔවුන් බලපත්‍රය පාවිච්චි කිරීමට නියමිත කරුණු ආදිය බලපත්‍රයෙහි ඉතා පැහැදිළිව සහ පරික්ෂාකාරීව පිරවිය යුතු ය. — බලපත්‍රයේ සඳහන් කළ යුතු කරුණු

නිවාඩුවක් සඳහා නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් කරන විට එම බලපත්‍රය නිකුත් කරන හේතුව "නිවාඩු" සඳහා යන්න පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

2.6 ඉහත 2.1 උපඡේදයෙහි දක්වා ඇති, දුම්රිය ගමන් බලපත්‍රයන් නිකුත් කිරීමට බලය ලබා දී ඇති නිලධාරියා විසින් එම දුම්රිය ගමන් බල පත්‍රයෙහි තමන් විසින් ම අත්සන් කළ යුතු ය. අත්සන සහිත රබර් මුද්‍රාවක් තැබීමට අවසර දෙනු නො ලැබේ. — ගමන් බලපත්‍රවල අත්සන් තැබීම

2.7 නිදහස් දුම්රිය ගමන් බල පත්‍රයට අත්සන් තැබූ තැනැත්තා හැරෙන්නට වෙනත් අයෙකු විසින්, එහි කිසිඳු වෙනස් කිරීමක් සිදු නොකළ යුතු ය. අත්සන් තැබූ නිලධාරියා නොමැති අවස්ථාවක දී, දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීමට බලය ලත් වෙනත් නිලධාරියකු විසින් පමණක් එවැනි වෙනස් කිරීමක් සිදු කළ යුතු ය. එසේ වෙනස් කිරීමක් සිදු කරනු ලැබූ සෑම අවස්ථාවකදී ම, එම වෙනස් කිරීම සිදු කළ ස්ථානයන් හි, එම නිලධරයා විසින් තම අත්සන යොදා එයට පහළින් නම සහ තනතුරු නාමය ද සටහන් කළ යුතු වේ. තමන් වෙත නිදහස් දුම්රිය ගමන් බලපත්‍රය ලැබුනු පසු, එහි කිසිඳු අනවසර වෙනස් කිරීමක් සිදු නොවීමට වග බලා ගැනීමට බලපත්‍රය හිමි තැනැත්තා කටයුතු කළ යුතු වේ. — වෙනස් කිරීම්

## 3. නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් ප්‍රවේශ පත්‍රයකට හුවමාරු කර ගැනීම

3.1 නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් දුම්රිය ප්‍රවේශ පත්‍රයක් ලෙස භාවිතා කළ නොහැක. නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් භාවිතා කළ හැක්කේ ප්‍රවේශ පත්‍ර කවුන්ටරයට එය ඉදිරිපත් කොට, ගෙවීමකින් තොරව ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීම සඳහා ය. — නිදහස් දුම්රිය ගමන් බලපත්‍රය ප්‍රවේශ පත්‍රයක් ලෙස භාවිතා කළ නොහැකි

3.2 නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීම සඳහා භාවිතා කළ හැක්කේ, එහි සඳහන් දුම්රිය ස්ථානයෙන් පමණකි. — ප්‍රවේශ පත්‍ර ලබා ගත හැකි ස්ථාන

3.3 නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයේ සඳහන් දිනයට දින හතකට (07) පෙර සිට හෝ දින හතක් (07) ගත වන තෙක් හෝ ඒ වෙනුවට ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීමට අවකාශ තිබේ. — ඉදිරිපත් කළ යුතු දිනය

3.4 නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් ඉදිරිපත් කොට ලබා ගත් ප්‍රවේශ පත්‍රයක් භාවිතා කළ හැක්කේ එහි නම සඳහන් තැනැත්තාට හෝ තැනැත්තන් හට පමණකි. කුමන හේතුවක් මත හෝ නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් වෙනත් තැනැත්තකු හට භාවිතා කිරීමට ලබා නොදිය යුතු ය. — ප්‍රවේශ පත්‍රය වෙනත් අයෙකුට පැවරිය නොහැකි ය.

3.5 තම නිදහස් දුම්රිය ගමන් බලපත්‍රය සමඟ හුවමාරු කරගත් ප්‍රවේශ පත්‍රයක් හිමි තැනැත්තකු හට, සාමාන්‍ය මගියකු විසින් එවැනි ප්‍රවේශ පත්‍රයන් වෙනුවෙන් ගෙන යාමට අවසර ඇති ප්‍රමාණයට සමාන ගමන් මළු ප්‍රමාණයක් රැගෙන දුම්රිය ගමනේ යෙදීමට හිමිකම් ලබන්නේ ය. — ගමන් මළු හිමිකම

3.6 නිදහස් දුම්රිය ගමන් බලපත්‍රය සමඟ හුවමාරු කරගත් ප්‍රවේශ පත්‍රයක්, සාමාන්‍ය මගියකු විසින් ලබා ගත් ප්‍රවේශ පත්‍රයක් පරීක්ෂා කරන ආකාරයටම, දුම්රිය ටිකට් පරීක්ෂකවරුන් හෝ වෙනත් දුම්රිය නිලධරයකු විසින් පරීක්ෂා කරනු ලැබීමට යටත් ය. එවැනි දුම්රිය — දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය නීති වලට යටත්ය

ප්‍රවේශ පත්‍රයක් ලබා ගත් තැනැත්තකු, දුම්රිය ටිකට් පරීක්ෂකවරයා හෝ දුම්රිය නිලධරයකු වෙත තම ප්‍රවේශ පත්‍රය ගමන අවසානයේ දී භාරදීමට හෝ ගමනේ යෙදී සිටිය දී පරීක්ෂා කිරීම සඳහා ලබා දීමට අසමත් වන්නේ නම්, සාමාන්‍ය මගියෙකු තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අසමත් වන අවස්ථාවක දී ගෙවීමට සිදුවන ගමනේ සම්පූර්ණ ගාස්තුව සහ දඩය මෙන් සමාන ගමනේ සම්පූර්ණ ගාස්තුව සහ නියම කරනු ලබන දඩ මුදලක් ද ගෙවිය යුතු වේ.එසේ අයකරගත් ගමන් ගාස්තු සහ දඩ මුදල්, දුම්රිය දෙපාර්තමේන්තුව මගින් නැවත නොගෙවනු ඇත.

3.7 නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් වෙනුවට ප්‍රවේශ පත්‍රයක් හුවමාරු කරනු ලබන්නේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ රීති සහ කොන්දේසි පිළිපැදීමට යටත් විය.

*දුම්රිය රීති සහ කොන්දේසි වලට යටත් ව*

## 4. භාවිතා නොකළ නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර සහ ප්‍රවේශ පත්‍ර

4.1 නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ තැනැත්තෙකු විසින්, තමන්ට නිකුත් කළ නිදහස් දුම්රිය ගමන් බලපත්‍රය හෝ එය සමග හුවමාරු කරගත් ප්‍රවේශ පත්‍රයක් භාවිතයට නො ගැනීම හේතුවෙන්, එම ප්‍රවේශ පත්‍රයේ හෝ ගමන් බලපත්‍රයේ වටිනාකම, දුම්රිය දෙපාර්තමේන්තුවෙන් / කොමිෂන් සභාවෙන් / උසස් අධ්‍යාපන ආයතනයකින් / විද්‍යායතනයකින් තමන්ට ගෙවන ලෙසට ඉල්ලා සිටීමට අවකාශ නොමැත. භාවිතා නො කළ සෑම දුම්රිය ගමන් බලපත්‍රයක් ම, එය නිකුත් කළ නිලධරයා වෙත වහාම භාරදිය යුතු වේ.

*භාවිතා නො කළ නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර සහ ප්‍රවේශ පත්‍ර නැවත භාරදිය යුතු ය*

4.2 නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් ඉදිරිපත් කොට හුවමාරු කරගත් ප්‍රවේශ පත්‍රයක් භාවිතා නොකර සිටීම හෝ එය අර්ධ වශයෙන් භාවිතා කිරීම, තමන් ගමන ආරම්භ කිරීමට නියමිත දුම්රිය ස්ථානයේ කාර්ය භාර නිලධරයා වෙත, ගමනේ යෙදීමට නියමිතව තිබූ කාලය ඇතුලත දී වාර්තා කළ යුතු ය. එසේ වාර්තා කිරීමෙන් අනතුරුව, ගමනේ නො යෙදුන බවට දුම්රිය ස්ථානාධිපතිවරයාගෙන් ඔහුගේ අත්සන යටතේ දිනය සහ වේලාව ද සටහන් කොට ප්‍රවේශ පත්‍රයේ සටහනක් ද ලබා ගත යුතු වේ. භාවිතා නො කළ ප්‍රවේශ පත්‍රය, දුම්රිය ස්ථානාධිපතිවරයාගේ සටහන ද සමඟ, නිදහස් දුම්රිය ගමන් බලපත්‍රය නිකුත් කළ නිලධරයා වෙත හැකි විගස ආපසු භාරදිය යුතු අතර, තමන් හට ප්‍රවේශ පත්‍ර භාවිතා කිරීමට නො හැකි වූ කරුණු ද ඒ සමඟම දැන්විය යුතු ය.

*ප්‍රවේශ පත්‍ර භාවිතා නො කිරීම*

4.2.1 භාවිතා නො කළ ප්‍රවේශ පත්‍රයක වටිනාකම කොමිෂන් සභාවට හෝ අදාල උසස් අධ්‍යාපන ආයතනයට/ විද්‍යායතනයට නැවත ලබා ගැනීම සඳහා, නියමිත අයදුම් පත දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීවරයා වෙත, එම ප්‍රවේශ පත්‍රය නිකුත් කළ කාර්යාලය විසින් ඉදිරිපත් කළ යුතු ය. එසේ අයදුම් කරන විට, අදාල දුම්රිය ප්‍රවේශ පත්‍රය භාවිතා කිරීමට නො හැකි වූ සම්පූර්ණ කරුණු ද එම අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ. ඒ සමඟ ම, භාවිතා නොකළ ප්‍රවේශ පත්‍රයෙ හි, දුම්රිය ස්ථානාධිපති විසින් එම ප්‍රවේශ පත්‍රය භාවිතා නොකළ බවට තබන ලද සටහන් ද ඉදිරිපත් කළ යුතු වේ.

*මුදල් ආපසු ගෙවීම*

4.2.2 නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රයකට හුවමාරු කරගත්, එහෙත් භාවිතා නොකළ ප්‍රවේශ පත්‍රයක් නැවත ලබා ගත් විට, එම වටිනාකම ලබා ගැනීම පිණිස, ඉහත සඳහන් කොට ඇති ආකාරයට අයදුම් පතක් දුම්රිය ප්‍රධාන ගණකාධිකාරීවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ භාවිතා නො කළ ප්‍රවේශ පත්‍රයේ වටිනාකම නැවත ලබා ගත් විට, එම තැනැත්තා හටම නැවත වරක් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් කළ හැකි අතර, එසේ නිකුත් කළ යුත්තේ පවත්නා වර්ෂය තුළ දී පමණක් වේ. එවැනි නිදහස් දුම්රිය නිවාඩු ගමන් බලපත්‍ර ඉදිරි වර්ෂය සඳහා රැගෙන යා නොහැකි ය.

නිවාඩු ගමන් බලපත්‍රයක වටිනාකම නැවත ලබා ගැනීම

## 5. බිල්පත් පරීක්ෂා කිරීම සහ නිරවුල් කිරීම

5.1 නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර සඳහා නිකුත් කළ ප්‍රවේශ පත්‍ර වෙනුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුදල් ඇතුලත් බිල්පත්, පිටපත් දෙකකින් යුතුව එම දෙපාර්තමේන්තුව විසින් අදාල පරිදි කොමිෂන් සභාවට හෝ අදාල උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට යවනු ලැබේ.

බිල්පත් නිරවුල් කිරීම

5.2 දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කරන නිලධාරියා විසින්, දුම්රිය බිල්පත් නිකුත් කිරීමේ වාර්තා ඇතුලත් රෙජිස්ටරය සමඟ එවා ඇති බිල්පත් සසඳා පරීක්ෂා කළ යුතු අතර, නිවාඩු ගමන් බලපත්‍රයක් නම් ඒවායේ "කවුන්ටර් ෆොයිල්" (Counterfoil) සමඟ පරීක්ෂා කොට තැබිය යුතු ය. දුම්රිය දෙපාර්තමේන්තුව විසින් අය කරගත් ගාස්තු ප්‍රමාණයන් හි නිරවද්‍යභාවය, එම ගාස්තු මගී දුම්රිය ගාස්තු ලේඛනයෙන් සහ භාණ්ඩ ප්‍රවහන ගාස්තු ලේඛනය ද සමඟ සංසන්දනය කොට පරීක්ෂා කළ යුතු ය. එහිදී යම් වෙනස් වීමක් නිරීක්ෂණය වුවහොත්, ඒ බව වහාම දුම්රිය ප්‍රධාන ගණකාධිකාරීවරයා වෙත වාර්තා කළ යුතු වේ.

ලේඛන පවත්වාගෙන යාම

5.3 බිල්පත් සඳහා ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් අඩංගු කොට වවුචර් පතක් පිළියෙල කොට, එය බලපත්‍ර නිකුත් කරන නිලධාරියා විසින් සහතික කොට, අදාල පරිදි චෙක් පතක් නිකුත් කිරීම සඳහා ගණකාධිකාරීවරයාට / මූල්‍යාධිකාරීවරයාට / භාණ්ඩාගාරික හට ඉදිරිපත් කළ යුතු වේ.

චෙක්පත් දුම්රිය ප්‍රධාන ගණකාධිවරයා වෙත ආමන්ත්‍රණය කළ යුතු ය

5.4 නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන්, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් එවනු ලබන බිල්පත්, එම බිල්පත් ලැබුනු වහාම පියවීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු වේ. බලපත්‍ර නිකුත් කරන නිලධාරීන් විසින් නො පියවන ලද බිල්පත් තිබේ ද යන්න පරීක්ෂා කොට එසේ නො පියවීමට පාදක වූ හේතු ගැන ද සෑහීමට පත්විය යුතු ය.

වහාම පියවිය යුතු ය

## 6. නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර

6.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක පහත සඳහන් තැනැත්තන් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා හිමිකම් ලබති.

6.1.1 පනතෙහි සඳහන් නියමයන්ට අනුව ස්ථිර කාර්ය මණ්ඩලය ලෙස නම් කොට ඇති කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනක සේවකයින් — ස්ථිර කාර්ය මණ්ඩලය

6.1.2 රාජ්‍ය සේවයේ, පළාත් පාලන සේවයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුතු නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර හිමි තැනැත්තන්, කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයකට / විද්‍යායතනයකට ද්විතීයන පදනම යටතේ සේවයට පැමිණි විට — ද්විතීයනය යටතේ පැමිණි සේවකයින්

6.1.3 විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ලැබූ තැනැත්තන්, වසරකට එක් නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් ලැබීමට සුදුසුකම් ලබති.

6.2 සප්ත වාර්ෂික නිවාඩු සහ ගුවන් ගමන් ගාස්තු ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තන් හට ද නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කළ හැකි අතර, එම තැනැත්තන් සප්ත වාර්ෂික නිවාඩු මත ගුවන් ගමනක යෙදෙන විට, X වන පරිච්ඡේදයේ 37.13 උපඡේදයෙහි සඳහන් ආකාරයකට, නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රයට අයවිය යුතු ගාස්තුව අඩු කිරීමේ කොන්දේසියට යටත්ව ගුවන් ගමන් ගාස්තු ගෙවිය හැකි ය. — සප්ත වාර්ෂික නිවාඩු සඳහා හිමිකම් ලැබූ තැනැත්තන්

6.3 යම් තැනැත්තකුගේ සේවය අත්හිටුවා ඇති අවස්ථාවක දී හෝ වැඩ තහනම් කොට ඇති අවස්ථාවක දී, එසේ වැඩ තහනම් ඇති හෝ සේවය අත්හිටුවා ඇති කාලය තුල දී එම තැනැත්තා නැවත සේවයේ පිහිටු වන තෙක් නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් නොකළ යුතු ය. — වැඩ තහනම් කරනු ලැබූ තැනැත්තන්

## 7. වර්ෂිකව ලබා ගත හැකි නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර ප්‍රමාණය

7.1 මෙම පරිච්ඡේදයේ 1.1 සහ 1.2 යන උපඡේද යටතේ නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර ලබා ගැනීමට හිමිකම් ඇති කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන්, එක් මුදල් වර්ෂයක දී ද්විත්ව ගමන් වාර තුනකට (03) හෝ එක් ගමන් වාරයක් බැගින් ගමන් වාර හයකට (06) එනම්, බලපත්‍ර කට්ටල තුනක් (03) ලබා ගැනීමට හිමිකම් ලබති. “ ගමන් වාරයක් ” යනුවෙන් අදහස් කරනුයේ දුම්රිය ස්ථාන දෙකක් අතර දුම්රියෙන් ගමන් ගන්නා අවස්ථාවන් ය. — එක් මුදල් වර්ෂයක් තුල ලබා ගත හැකි බලපත්‍ර ප්‍රමාණය

7.2 යම් මුදල් වර්ෂයක් තුල දී සේවයෙන් විශ්‍රාම ලබන තැනැත්තකු හට නිකුත් කළ හැකි නිදහස් නිවාඩු දුම්රිය බලපත්‍ර ප්‍රමාණය ඔහු එම වර්ෂය තුල දී තමා සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත දිනය දක්වා සේවය කළ මාස ගණනට සමානුපාතිකව ගණන් බලා නිකුත් කළ යුතු වේ. (එනම්, යම් වර්ෂයක් තුල දී නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර කට්ටල තුනට ම (03) හිමිකම් ඇති තැනැත්තකු එම වර්ෂයේ පස් වැනි මාසයකට පෙර විශ්‍රාම ලබන්නේ නම්, ඔහුට හිමිවන්නේ එක් (01) බලපත්‍ර කට්ටලයක් පමණකි. එසේම, යම් තැනැත්තකු එම වර්ෂයේ නව වැනි (09) මාසයට පෙර විශ්‍රාම ලබන්නේ නම්, ඔහුට බලපත්‍ර කට්ටල දෙකක් (02) හිමිවේ.) — විශ්‍රාම ලබන වර්ෂයේ කොටසක් සඳහා

7.3 සෑම දුම්රිය ගමන් බල පත්‍රයක්ම නිකුත් කිරීමට පෙර, නිකුත් කරන දිනය සඳහන් කළ යුතු අතර, එම දිනය බලපත්‍රය නිකුත් කරන මුදල් වර්ෂයට අදාලව බල පැවැත් වේ.

දාතම් කිරීම සහ බල පැවැත්වීම

7.4 තනි ගමනක් සඳහා නිකුත් කළ දුම්රිය ගමන් බලපත්‍රයක්, ඉදිරියට මුදල් ගෙවා දෙවැනි ගමනක් සඳහා ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට හුවමාරු නො කළ යුතු ය.

තනි ගමන් බලපත්‍ර භාවිතා කිරීම

## 8. නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර මගින් ගමන් කළ හැකි පංතිය

8.1 නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රයක් ලබා ගත් තැනැත්තකු හට ගමන් කිරීමට නියමිත පංතිය මෙම පරිච්ඡේදයේ 1.3 උපඡේදයෙහි සඳහන් ආකාරයට ම විය යුතු වේ.

1.3 උපඡේදයෙහි සඳහන් ආකාරයට

8.2 යම් පංතියක ගමන් කිරීමට හිමිකම් ඇති නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර හිමි තැනැත්තෙකු හට, ඔහුගේ මනාපය පරිදි එයට වඩා පහල පංතියක ගමන් කිරීමට නිවාඩු දුම්රිය බලපත්‍ර නිකුත් කළ හැකි ය.

පහළ පංතියක ගමන් කිරීම

පහළ පංතියක ගමන් කිරීමට නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් කළ විට, එම බලපත්‍රයද මෙහි 1.5.2. උපඡේදයේ කරුණු වලට අදාලව නිකුත් කරන ලද දුම්රිය ගමන් බලපත්‍රයක් ලෙස සැලකේ.

8.3 යම් පංතියක ගමන් කිරීම සඳහා නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රයක් ලබා ගත් තැනැත්තකු, එම පංතියට වඩා ඉහළ පංතියක ගමන් කිරීමට අදහස් කරන්නේ නම්, එසේ ඉහළ පංතියක ගමන් කිරීමට ගෙවිය යුතු මුදලේ වෙනස, දුම්රිය ස්ථානයේ ප්‍රවේශ පත් කවුළුවට ගෙවා ඉහළ පංතියක ප්‍රවේශ පත් ලබා ගත හැකි ය.

ඉහළ පංතියක ගමන් කිරීම

8.4 පළමු වැනි හෝ දෙවැනි පංතියේ ගමන් කිරීම සඳහා නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර හිමි තැනැත්තෙකු හට, නිදන මැදිරියක හෝ නිදන ආසනයක ගමන් කිරීමට අවශ්‍ය වූ විට, ගමන් ගැනීමට නියමිත දුම්රියේ එම පහසුකම් තිබේ නම්, සහ දුම්රිය දෙපාර්තමේන්තුවේ එවැනි පහසුකම් සැපයීමට අදාල රෙගුලාසි වලට අනුව, ලබා ගත හැකි ය.

නිදන මැදිරි සහ නිදන ආසන

8.5 පළමු වැනි පංතියේ ගමන් කිරීමට හිමිකම් ඇති තැනැත්තකු, දුම්රිය දෙපාර්තමේන්තු මගින් එවැනි පහසුකම් ලබාදීමට අදාල රෙගුලාසි වලට යටත් ව නිරීක්ෂණ මැදිරි සහ වායු සමනය කළ මැදිරියක ගමන් කිරීමට සුදුසුකම් ලබයි. එවැනි අවස්ථාවන්හි දී අදාල දුම්රිය ගමන් බලපත්‍රයේ දකුණු පස ඉහළ කෙළවරේ සුදුසු පරිදි ''නිරීක්ෂණ මැදිරියේ ගමන් කිරීම පිණිස'' හෝ ''වායු සමනය කළ මැදිරියේ ගමන් කිරීම පිණිස'' හෝ '' නිදන මැදිරියක ගමන් කිරීම පිණිස'' හෝ "නිදන ආසනයක ගමන් කිරීම" ආදි වශයෙන් සටහනක් යෙදිය යුතු වේ.

නිරීක්ෂණ මැදිරි සහ වායු සමනය කළ මැදිරි

## 9. පවුල්

9.1 නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රයක් හිමි තැනැත්තකුගේ පවුලේ සෑම සාමාජිකයකුට, එම තැනැත්තාට හා සමානව ම දුම්රිය ගමන් බලපත්‍ර ලබා ගැනීමට හිමිකම් තිබේ — පවුලේ සාමාජිකයා හට ද සමාන හිමිකම්

9.1.1 මෙම කරුණ සඳහා "පවුල" යන්නෙන් අර්ථ කථනය වන්නේ, කලත්‍රයා, නිලධරයාගෙන් යැපෙන අවිවාහක ගැහැණු දරුවන්, සහ වයස අවුරුදු දහ අටට ( 18) අඩු පිරිමි දරුවන් ය. — විවාහක නිලධාරියෙකුගේ "පවුල" යන්නට අර්ථ කථනය

9.2 අවිවාහක හෝ වැන්දඹු හෝ බිරිඳ මිය ගිය හෝ තැනැත්තකුගේ / තැනැත්තියකගේ පියා / මව / සහෝදරිය හෝ එම නිලධරයාගෙන් යැපෙන සහෝදරයෙකු හට, එම නිලධරයා හා සමානව ම නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර ලබා ගැනීමට හිමිකම් ඇත. — අවිවාහක තැනැත්තන් සහ වැන්දඹුවන්

කෙසේ වුවද, එසේ යැපෙන සියළු දෙනාටම දෙනු ලබන බලපත්‍ර ප්‍රමාණය, තනි ගමන් බලපත්‍ර හයකට (06), [ද්විත්ව ගමන් බල පත්‍ර තුනකට (03) ] නො වැඩි විය යුතු ය.

9.2.1 මෙහි ඉහත 9.2 උපඡේදය යටතේ එක් පවුලක් සම්බන්ධයෙන් අනුග්‍රහය ලබා දිය හැක්කේ, නිවාඩු බලපත්‍ර හිමිකම ඇති එක් තැනැත්තෙකු සඳහා පමණකි. — එක් පවුලක එක් තැනැත්තකු පමණී

නිදර්ශනය: මව/ පියා සහ/ හෝ සහෝදරියක්/ සහෝදරයෙක්, නිදහස් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර සඳහා හිමිකම් ඇති අවිවාහක පුතුන් දෙදෙනෙකුගෙන් යැපෙන විට, එම පුතුන්ගෙන් එක් අයෙකුට පමණක් මෙහි 9.2 උපඡේදය පරිදි අදාල හිමිකම ලබා ගැනිමට සුදුසුකම් ලබයි.

9.3 මව/පියා සහ/හෝ සහෝදරිය/සහෝදරයා සම්බන්ධයෙන් "යැපෙන්නා" යනුවෙන් අදහස් කරනුයේ සත්‍ය වශයෙන්ම සහ ප්‍රමාණවත් ලෙස එම තැනැත්තාගෙන් යැපෙන අයවළුන් ය. — යැපෙන්නන්

මෙම කරුණ තීරණය කරනු ලබන්නේ, බලපත්‍ර අයදුම් කරන තැනැත්තා විසින්, ඉහත සඳහන් අයවළුන් නඩත්තු කිරීම පිළිබඳ බහුතර වගකීම එම තැනැත්තාට පැවැරී ඇති බවට, සෑහීමට පත් වීමෙන් පසු කොමිෂන් සභාවේ ලේකම්වරයා / විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා / මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා /විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයා / උසස් අධ්‍යාපන ආයතනයක, මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා විසින් ය.

"යැපෙන්නා" යන්න නිශ්චය කර ගැනීම සඳහා, පහත සඳහන් ප්‍රශ්න වලට පිලිතුරු සපයා ගැනීම මඟින් උපකාරී වනු ඇත.

මව / පියා සහ / හෝ සහෝදරිය / සහෝදරයා ඇත්ත වශයෙන් ම ජීවත් වන්නේ, අදාල තැනැත්තා සමඟ ද යන්න හෝ එසේ නොමැති නම්, ඉහත සඳහන් තැනැත්තන්ගේ යැපීම වෙනුවෙන්,

ඔහු විසින් නොකඩවා, ප්‍රමාණවත් මුදලක් තැන්පත් කරන්නේ ද යන්න ගැන ප්‍රමාණවත් සාක්ෂි තිබීම.

දෙමාපියන්ට හිමි චංචල හා නිශ්චල දේපල තිබේ ද යන්න සහ එසේ තිබේ නම්, එකී වටිනාකම සහ දේපල වලින් උපයාගන්නා ආදායම

මව / පියා සහ/ හෝ සහෝදරිය / සහෝදරයා හට යැපීම සඳහා අනුග්‍රහය දැක්වීමට තරම් හැකියාවක් ඇති රජයේ / රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් ස්ථානයක සේවයේ නියුතු වෙනත් තැනැත්තකු, පවුල තුල නොමැති ද යන්න සහ එවැන්නෙකු සිටී නම්, ඔහු දැනටමත්, මව / පියා සහ / හෝ සහෝදරිය / සහෝදරයා වෙනුවෙන් මෙම පහසුකම ලබා ගෙන ඇත් ද යන්න.

9.3.1 "සහෝදරිය" යන වචනයට වැන්දඹු සහෝදරියක් ඇතුලත් නොවේ.

9.3.2 යම් තැනැත්තෙකුගෙන් යැපෙන්නේ නැති සුළු මව, සුළු පියා හෝ දරුකමට ගත් ළමයින් හට නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර හිමි නොවේ. දරුකමට ගත් ළමයින් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර සඳහා හිමිකම් ලබන්නේ කොමිෂන් සභාවේ ලේකම්වරයා / විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරයා / මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා / විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයා / උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනයක, මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා විසින් එසේ දරුකමට ගැනීම නීත්‍යානුකූලව සහ අවංක අදහසින් කර ඇති බවට සෑහීමට පත්වන අවස්ථාවල දී පමණකි. — සුළු මව ආදීන් සහ දරුකමට ගත් ළමයින්

9.4 යම් තැනැත්තෙකු විවාහ පත්වන මුදල් වර්ෂය සඳහා ඔහුගේ කලත්‍රයා වෙනුවෙන් නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කළ හැක්කේ, ඔහු විවාහ වූ දින සිට එම වර්ෂයෙන් ඉතිරි ව ඇති එක් එක් මාස හතර (04) බැගින් සම්පූර්ණ කර ඇති කාල පරිච්ඡේදයක් සහ ඉන් කොටසක් සඳහා නිවාඩු බලපත්‍ර එක් කට්ටලයක් බැගින් ය. කෙසේ වුවද, එසේ කලත්‍රයාට නිකුත් කරනු ලබන බලපත්‍ර ගණන සහ ඔහුගේ මවට/පියාට සහ/හෝ සහෝදරියට/ සහෝදරයාට එම වර්ෂය තුල දී, කලින් ඉහත 9.2 උපඡේදය යටතේ නිකුත් කර ඇති බලපත්‍ර වල ද එකතුව, එම වර්ෂය වෙනුවෙන් අදාල තැනැත්තාට හිමි බලපත්‍ර කට්ටල ගණන නො ඉක්මවිය යුතු වේ. — විවාහයේ දී සමානුපාතිකව හිමිකම ලැබීම

9.5 යම් තැනැත්තෙකු හට (සප්ත වාර්ෂික නිවාඩු හිමි තැනැත්තෙකු හැරුණු විට) විදේශ නිවාඩු ලබා දුන් විට, එම තැනැත්තාගේ මෙරට සිටින පවුලේ සාමාජිකයන් හට ඉහත 7.1 උපඡේදයේ සඳහන් පරිදි නිදහස් දුම්රිය නිවාඩු බලපත්‍ර ලබා ගැනීමට හිමිකම තිබේ. එම තැනැත්තා නැවත දිවයිනට පැමිණි පසු, ඔහුට ද නිවාඩු දුම්රිය බලපත්‍ර ලබා ගැනීමට අවසර දිය හැකි ය. — විදේශ නිවාඩු ලබා සිටින විට

9.6 කලත්‍රයන් දෙදෙනාම නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර සඳහා හිමිකම් ලබන විට;

9.6.1 දෙදෙනාම දුම්රිය ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා හිමිකම් ලබා ඇති විටක දී සහ එක් අයෙකු හෝ දෙදෙනාගේම කලත්‍රයන් සඳහා දුම්රිය ගමන් බලපත් ලබා ගැනීමට හිමිකම් ඇත්නම් ද, තමාගේ අයිතිය ලෙස දුම්රිය ගමන් බලපත්‍රයකට හිමිකම් තිබිය දී වුව ද, ඒ වෙනුවට කලත්‍රයා ලෙස දුම්රිය ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට මනාපය පළ කළ හැකි ය. මෙසේ මනාපය පළ කිරීම, එක් එක් මුදල් වර්ෂයක් ආරම්භයේ දී සිදු කළ යුතු අතර, එය එම වර්ෂය තුල දී නැවත වෙනස් කිරීමට අවකාශ නො මැත්තේය.

අන්‍යොන්‍ය හිමිකම් ලබාගත හැකි ය

9.6.2 තමන්ට හිමි නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රය සහ කලත්‍රයා වශයෙන් හිමි නිවාඩු දුම්රිය ගමන් බලපත්‍රය යන දෙකම ලබා ගැනීමට යම් තැනැත්තකු හට හිමිකමක් නොමැති අතර, ලබා ගත හැක්කේ එක් නිවාඩු දුම්රිය ගමන් බල පත්‍රයක් පමණකි.

දෙදෙනාටම නොවේ

9.6.3 මෙහි ඉහත සඳහන් උපඡේදයන්හි දක්වා ඇති කරුණු, නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර සඳහා හිමිකම් සහිත රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයක නියුතු කලත්‍රයකු සිටින කොමිෂන් සභාවේ හෝ ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන් හට ද බල පවත්වනු ඇත.

රජයේ, රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මන්ඩලයක කලත්‍රයන් සිටින විට

9.7 කොමිෂන් සභාවේ හෝ ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු තම ස්වාමිපුරුෂයාගෙන් / බිරිඳගෙන් නීත්‍යානුකූලව වෙන් වූ කලත්‍රයන් අවිවාහක තැනැත්තන් ලෙස සැලකේ. ඔවුන් නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කරන විට, තම විවාහයෙන් වෙන්වීම පිළිබඳව ප්‍රකාශයක් ලබාදිය යුතු ය. එවැනි දෙමාපියන්ගේ දරුවන් හට දුම්රිය ගමන් බලපත්‍ර ලබා දෙන්නේ, එම දරුවන්ගේ නීත්‍යානුකූල භාරකාරිත්වය දරන දුම්රිය ගමන් බලපත්‍ර හිමි මවගේ හෝ පියාගේ හිමිකමට පමණක් අනුව ය.

නීත්‍යානුකූලව වෙන් වූ කලත්‍රයන්

## 10. නිවාඩු දුම්රිය බලපත්‍ර සඳහා අයදුම් කිරීම

10.1 නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර සඳහා කරනු ලබන ඉල්ලීම්, ඒ සඳහා අනුමත කොට ඇති ආකෘති පත්‍රය පුරවා, එවැනි දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීමට බලය ලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වේ. (මෙම පරිච්ඡේදයේ 2.1 උපඡේදය බලන්න) නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර හිමි තැනැත්තෙකුගේ පවුලේ සාමාජිකයන් හට එම බලපත්‍ර අයදුම් කරන විට, නම් කොට ඇති අයවළුන් මෙම විධිවිධානයන්ට අනුව නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර ලබා ගැනීමට හිමිකම් ඇති බව දැක්වෙන සහතිකයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කරන බලධාරීන් වෙත

10.2 කලත්‍රයන් දෙදෙනාම, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ යෙදී සිටින විට, ස්වාමිපුරුෂයා හෝ භාර්යාව විසින් තමන් දෙදෙනාට හෝ තම දරුවන් විෂයයෙහි ඉදිරිපත් කරන දුම්රිය නිවාඩු බලපත්‍ර සඳහා අයදුම්පත, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කරන නිලධරයා වෙත, මෙහි 9.6.1 උපඡේදය පරිදි ඉදිරිපත් කළ යුතු ය. — කලත්‍රයන් දෙදෙනාම සේවයේ යෙදී සිටින විට

10.3 අවුරුදු තුනට (03) අඩු දරුවන් සඳහා නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කරනු නො ලැබේ. වයස අවුරුදු තුනට (03) හෝ ඊට වැඩි සහ අවුරුදු දොළහට (12) අඩු ළමයින් සඳහා භාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. — ළමයින්

10.4 දුම්රිය ස්ථාන දෙකක් අතර කෙරෙන එක් එක් ගමන් වාරයක් වෙනුවෙන් වෙන වෙනම දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කළ යුතු ය. එකම දුම්රිය ස්ථාන දෙකක් අතර, ද්විත්ව ගමනක් සඳහා හෝ යාමට සහ ඒමට ආදී වශයෙන් බලපත්‍ර ඉල්ලා සිටින විට, බැහැර යන ගමන සඳහා සහ ආපසු එන ගමන සඳහා බලපත්‍ර දෙකක් නිකුත් කළ යුතු වේ. — සෑම ගමනක් සඳහාම වෙන් වශයෙන් බලපත්‍ර තිබිය යුතු ය

10.5 දුම්රිය ගමන් බලපත්‍රයෙහි, එය නිකුත් කළ දිනය සහ ගමනේ යෙදීමට නියමිත දිනය ද සඳහන් විය යුතු ය. මෙම දින දෙක අතර කාලය මෙහි පහත සඳහන් 10.7 උපඡේදයෙහි සඳහන් බැහැරවීමට යටත් ව දින තිහක් (30) ක් ඉක්මවා නොයා යුතු ය. — නිකුත් කරන දිනය සහ ගමනේ යෙදෙන දින

10.6 දුම්රිය ගමන් බලපත්‍රයෙහි සඳහන් "ගමනේ යෙදෙන දිනය" ට දින දහ හතරක් (14) පෙරාතුව හෝ එම දිනයට දින දහ හතරක් (14) පසුව හෝ ගමන් බලපත්‍රය භාවිතා කළ හැකි ය. — වලංගු කාලය

10.7 ගමන සඳහා කලින් වෙන් කරවා ගැනීමක් සිදු කරන අවස්ථාවක දී (එනම් නිදන මැදිරියක, නිදන ආයතනයක, නිරීක්ෂණ මැදිරියක හෝ වායු සමනය කරන ලද මැදිරියක ) ආපසු එන ගමන සඳහා අවශ්‍ය වෙන් කරවා ගැනීම් සඳහා පහසු වනු පිණිස, බලපත්‍රය නිකුත් කරන දින සිට දින හතළිස් පහක (45) කාලයක් තුල දිනයක් ආපසු එන දිනය ලෙස බලපත්‍රයේ සටහන් කළ හැකි ය. — කලින් වෙන් කරවා ගැනීම සඳහා අවශ්‍ය ගමනේ යෙදෙන දිනය

10.8 දුම්රිය ගමන් බලපත්‍රයක් භාවිතා කරමින් ගමන් කිරීම පවත්නා දුම්රිය රෙගුලාසි වලට යටත්ව සිදු වේ. — දුම්රිය රෙගුලාසි

## 11. භාවිතා නොකළ බලපත්‍ර සහ ප්‍රවේශ පත්‍ර

11.1 භාවිතා නොකළ දුම්රිය ගමන් බලපත්‍ර, එම බලපත්‍ර නිකුත් කළ නිලධරියා වෙත, එම බලපත්‍ර ලැබුනු දිනයේ සිට දින තුනක් ඇතුලත භාරදිය යුතු ය. — භාවිතා නොකළ නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර

11.2 භාවිතා නොකළ දුම්රිය ප්‍රවේශ පත්‍ර ද, ඒවාට ආපසු මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම සඳහා, නිකුත් කළ නිලධරියා වෙත හැකි විගස ආපසු භාරදිය යුතු වේ. — භාවිතා නොකල ප්‍රවේශ පත්‍ර

11.2.1 දුම්රිය ගමන් බලපත්‍රයක් ඉදිරිපත් කොට ලබාගත් ප්‍රවේශ පත්‍රයක් භාවිතා නොකර සිටි විට, ඒම ප්‍රවේශ පත්‍ර ද

භාවිතා කරන ලද ප්‍රවේශ පත්‍රයක් ලෙස ගණන් ගැනේ. කෙසේ වුවද, භාවිතා නොකළ ප්‍රවේශ පත්‍රයක් නැවත දුම්රිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කොට, එම මුදල් ආපසු ආයතනය වෙත ලබා ගත්තේ නම්, එම භාවිතා නොකළ ප්‍රවේශ පත්‍රය වෙනුවට නව දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමට හැකියාව ඇත. මෙහි දී ඉහත 4.2 සහ 4.2.1 උපජේදයන්හි සඳහන්, භාවිතා නොකළ ප්‍රවේශ පත්‍රයෙහි අදාල දුම්රිය ස්ථානාධිපතිගේ සටහනක් යොදා තිබීමේ අවශ්‍යතාවය ගැන විශේෂ අවධානය යොමු කළ යුතු අතර, එවැනි සටහනක් නොමැති කල් හි, නිදහස් දුම්රිය ගමන් බලපත්‍රයක් සඳහා නිකුත් කරන ලද දුම්රිය ප්‍රවේශ පත්‍රයකට නැවත මුදල් ලබා දීම හෝ ඒ වෙනුවට වෙනත් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම හෝ දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් සිදු නොකර සිටිය හැක. එසේ සිදුවන අවස්ථාවක දී, දුම්රිය දෙපාර්තමේන්තුවට යම් අවලංගු කිරීමේ ගාස්තුවක් ගෙවීමට සිදුවන්නේ නම්, එම ගාස්තුව ආදාල තැනැත්තා විසින් දැරිය යුතු ය.

11.3 ඇත්ත වශයෙන්ම ගමන් ගන්නා තැනැත්තන් ගණනට වඩා වැඩි පිරිසකට දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් නොකළ යුතු අතර, ගමනාන්තය ලෙස දක්වා ඇති ස්ථානයෙන් ඔබ්බට ද එකී බලපත්‍ර නිකුත් නොකළ යුතු ය. එහෙත් යම් කලින් වලක්වා ගැනීමට නො හැකි හේතුන් මත, ගමන් බලපත්‍රයෙහි සඳහන් පිරිසට වඩා අඩු තැනැත්තන් ප්‍රමාණයක් ගමනෙහි යෙදුනේ නම්, දුම්රිය ගමන් බලපත්‍රය හිමි තැනැත්තා විසින්, ඒ බව ගමන් බලපත්‍රයෙහි සටහන් කොට එහි තම අත්සන ද තැබිය යුතු ය. දුම්රිය ගමන් බලපත්‍රය දරන්නා එම ගමන් පත්‍රය ඉල්ලුම් කරන තැනැත්තා නොවන අවස්ථාවක දී, මෙම අවශ්‍යතාවය ගමන් බලපත්‍රය දරන්නා වෙත දැන්වීම, බලපත්‍රය ඉල්ලුම් කළ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

කොටසක් පමණක් භාවිතා කළ බලපත්‍ර

11.4 නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර වෙනුවෙන් මුදල් ලබා දීමට අවසර නොමැත.

මුදල් ලබා දිමට අවසර නොමැත

## 12. දුම්රිය ගමන් බලපත්‍ර සහ ප්‍රවේශ පත්‍ර අවභාවිතා කිරීම

12.1 දුම්රිය ගමන් බලපත්‍රයන්ට හුවමාරු කරගත් දුම්රිය ප්‍රවේශ පත්‍රයක් භාවිතා කළ හැක්කේ එම බල පත්‍රයෙහි නම් සඳහන් කොට ඇති තැනැත්තන් හට පමණකි. එමෙන්ම එම ගමන් බලපත්‍රයෙහි සඳහන් සීමාවන් සහ කාලවකවානු තුල ගමන් කළ යුතු වේ. දුම්රිය ගමන් බලපත්‍ර වෙනත් අයෙකුට පැවරීම කළ නො හැකි ය.

වෙනත් අයෙකු හට පැවරීමට නො හැකි ය

12.2 දුම්රිය ප්‍රවේශ පත්‍රය හෝ බලපත්‍රය වෙනත් අයෙකුට පැවරීම හෝ එහි සඳහන් දිනයන්ට වෙනත් දිනයක ගමනේ යෙදීම ද, නියමිත ගමනට වඩා වෙනස් කොටසක ගමනේ යෙදීම ද, එම දුම්රිය ගමන් බලපත්‍රය දරන්නාට විරුද්ධව නඩු පැවරීමට හෝ විනයානුකූලව කටයුතු කිරීමට ද හේතු විය හැකි ය. .

12.3 දුම්රිය ගමන් බලපත්‍රයක් හෝ ප්‍රවේශ පත්‍රයක් භාවිතා කරන බලපත්‍රය හිමි තැනැත්තාගෙන් යැපෙන්නෙකු විසින් එම බලපත්‍රය

යැපෙන්නා විසින් අවභාවිතා කිරීම

හෝ ප්‍රවේශ පත්‍රය අවභාවිතා කිරීම, බලපත්‍ර හිමි තැනැත්තාගේ ඊළඟ නිවාඩු ගමන් බලපත්‍ර කට්ටල තුන (03) අහිමි කර ගැනීමට හේතු විය හැකි අතර, එසේ අවභාවිතා කළා යැයි වාර්තා වූ දිනයේ සිට ඉදිරි වර්ෂයක කාලය සඳහා, ඔහුට නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් නො කිරීමටද කටයුතු කළ යුතු වේ.

12.4 යම් සේවකයකු විසින් දුම්රිය ගමන් බලපත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය අවභාවිතා කළ අවස්ථාවක දී සහ කර ඇති වරද, සේවයෙන් පහකිරීමට තරම් බරපතල එකක් නොවූ විට වෙනත් ඕනෑම දඬුවමකට අමතරව, තමන්ට හිමිවීමට ඇති ඉදිරි දුම්රිය ගමන් බලපත්‍ර කට්ටල තුන (03) අහිමි කිරීමට හේතු වේ. එසේ කුමන හේතුවක් නිසා වුව ද, එම වරද වාර්තා වූ දිනයේ සිට ගණන් ගන්නා ඉදිරි වර්ෂය තුල දී ඔහුට කිසිදු දුම්රිය ගමන් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

සේවකයා විසින් අවභාවිතා කිරීම

13. **වාර්තා කිරීම සහ ගිණුම් ගත කිරීමේ ක්‍රමවේදය**

13.1 එක් එක් තැනැත්තා හට දුම්රිය නිවාඩු ගමන් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ තොරතුරු ලේඛන ගත කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තු විසින් පවත්වා ගෙන යනු ලබන ආකෘතීන් ආශ්‍රයෙන් සකස් කළ නිවැරදි සහ සම්පූර්ණ ලේඛනයක් සකස් කොට පවත්වා ගෙන යාම කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක වගකීම වන්නේ ය.

නියමිත ආකෘතියෙන් යුතු ලේඛනය

13.1.1 යම් නිලධාරියෙකු ස්ථාන මාරු කළ විට දී, ඔහු සේවය කළ කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින් ස්ථාන මාරුව ලද ආයතනය වෙත, එම නිලධරයා සහ ඔහුගේ යැපෙන්නන් හට පවත්නා මුදල් වර්ෂය තුල දී, ලබා දී ඇති නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර ප්‍රමාණය ගැන දැනුම් දිය යුතු ය. මෙම දැනුම් දීම් කරනු ලබන ලිපියේ අංකය සහ දිනය, එම තොරතුරු ලේඛන ගත කිරීම සඳහා පවත්වාගෙන යන ලේඛනයේ නිසි පරිදි සටහන් කොට, අදාල නිලධරයා ස්ථාන මාරුවක් ලබා ගිය ආයතනය වෙත ද එහි ලේඛන ගත කිරීම සඳහා දක්වා යැවිය යුතු ය.

ස්ථාන මාරු ලැබූ තැනැත්තන්

14. **අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර**

14.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු සියළුම තැනැත්තන්, තම නිවසේ සිට සේවය කරන ආයතනය පිහිටා ඇති ස්ථානය දක්වා දුම්රියෙන් ගමන් කිරීම පිණිස ලබා දෙන අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍රය සඳහා හිමිකම් ලබති.

හිමිකම

14.2 මෙම පරිච්ඡේදයේ 1.3 (ඇ) උපඡේදයෙහි සඳහන් පරිදි දෙවන පංතියේ ගමන් කිරීම සඳහා හිමිකම් ඇති සේවකයින් හට තම මනාපයට අනුව, තම නිවසට ආසන්නව පිහිටි දුම්රිය ස්ථානයේ සිට ආයතනය පිහිටි ස්ථානය දක්වා දෙවන පංතියේ හෝ තුන්වන පංතියේ ගමන් කිරීමට දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබාදිය හැකි ය.

ගමන් ගන්නා පංතිය

14.3 මෙම පරිච්ඡේදයේ 1.3 (ඇ) උපඡේදයෙහි සඳහන් පරිදි තුන්වන පංතියේ ගමන් කිරීම සඳහා හිමිකම් ඇති සේවකයින් හට තම නිවසට ආසන්න දුම්රිය ස්ථානයේ සිට සේවය කරන ස්ථානය දක්වා දුම්රියෙන් ගමන් කිරීමට තුන්වන පංතියේ අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර නිකුත් කළ හැකි ය.

14.4 අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන්නේ, නිවසේ සිට සේවා ස්ථානය දක්වා ඇති දුර සැතපුම් තිහ (30) නො ඉක්මවන අවස්ථාවන්හි දී ය. මෙකී දුර ප්‍රමාණය සැතපුම් තිහ (30) ඉක්මවන්නේ නම්, එවැනි දුරක සිට ගමන් කිරීම නිසා සේවකයාගේ කාර්යක්ෂමතාවයට සහ සේවයට බල නොපාන බවට කොමිෂන් සභාවේ සභාපතිවරයා, ලේකම්වරයා / විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා, ලේඛකාධිකාරීවරයා / විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා / මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා / උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනයක / මධ්‍යස්ථානයක අධ්‍යෂවරයා සෑහීමට පත් වන්නේ නම් විශේෂ අවස්ථාවක් ලෙස සලකා ඒ සඳහා අවසර දිය හැකි ය. නිවසේ සිට සේවය කරන ස්ථානය දක්වා ඇති දුර ප්‍රමාණය

14.5 අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර පහසුකම් ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇති සේවකයන්, ඒ සඳහා තම අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ, දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අදාල කරුණු වෙනුවෙන් අනුමත කොට ඇති ආකෘති පත්‍රය උපයෝගි කරගෙන ය. අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්ර සඳහා අයදුම්පත්

14.5.1 මෙම විෂයය භාරව කටයුතු කරන පරිපාලන නිලධාරීන් විසින්, අයදුම්කරුවන් අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට සුදුසුකම්ලත් තැනැත්තන් ද යන්න සහ තමා වෙත ඇති තොරතුරු වලට අනුව, අයදුම්පත්‍රයෙහි සඳහන් තොරතුරු නිවැරදි ද යන්න ගැන අයදුම්පතෙහි සහතික කොට දුම්රිය දෙපාර්තමේන්තුවට යැවීමට පෙර සෑහීමට පත්විය යුතු ය. අයදුම්කරුගේ තොරතුරු වල නිරවද්‍යතාවය

14.5.2 මෙකී අයදුම්පත් සමඟ, කොමිෂන් සභාවෙන් / උසස් අධ්‍යාපන ආයතනයකින් / විද්‍යායතනයකින් අයදුම් කර ඇති අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාවට අදාල නිකුත් කළ චෙක් පතක් ද අමුණා යැවිය යුතු ය. ආයතනයේ දායක වීම

14.5.3 කෙසේ වුවද, හුදෙක්ම ආයතනයේ සහ සේවකයාගේ යන දෙපාර්ශවයේම පහසුව උදෙසා, අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට හිමිකම් ඇති සේවකයින් විසින්, සාමාන්‍ය මාසික / ත්‍රෛයිමාසික වාර ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම කළ හැකි ය. එවැනි අවස්ථාවක දී, තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සඳහා වැය වූ මුදල සේවකයා හට ආයතනය වෙතින් ලබා ගත හැකි වේ. වාර ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීම මත මුදල් ගෙවීම

14.6 අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන්නේ, දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් එවැනි ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමට අදාලව පනවා ඇති රීති රෙගුලාසි වලට යටත්ව ය. දුම්රිය දෙපාර්තමේන්තුවේ රීති සහ රෙගුලාසි වලට යටත්ව

14.7 තමන් හට නිකුත් කර ඇති අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍රයක් භාවිතා කිරීමට නියමිත දුම්රිය ස්ථාන දෙක අතර, එම වාර ප්‍රවේශ පත්‍රය ස්ථාන මාරු වීම නිසා, පදිංචි ස්ථානයේ වෙනසක් වීම නිසා, සේවා ස්ථානයෙන් දිර්ඝ කාලයන් බැහැර වීමට සිදුවීම නිසා, භාවිතා නොකළ කාලයට අදාල ප්‍රවේශ පත්‍ර ආපසු භාර දීම

සේවය අත්හිටුවීම නිසා, මාස දෙකකට නොඅඩු කාලයක් විශ්‍රාම පූර්ව නිවාඩු ගැනීම නිසා හෝ වෙනත් කරුණක් මත සේවය නැවැත්වීමකට භාජනය වීම නිසා යන හේතුවක් මත භාවිතා කිරීමට නොහැකිවන අවස්ථාවක දී, එම ප්‍රවේශ පත්‍රය තමන් එකී වාර ප්‍රවේශ පත්‍රය ලබා ගත් කොමිෂන් සභාවට/ උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට ආපසු භාරදිය යුතු ය.

14.8 එසේ නැවත ලබාගත් සම්පූර්ණ මුදල් ප්‍රමාණයෙන්, කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට ලැබිය යුතු මුදල දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් එම ආයතනයන් හි අරමුදල් වලට බැර කෙරෙන අතර, ඉතිරිය අදාල සේවකයා වෙත ලබා දෙනු ඇත.

භාවිතා නොකළ කාලයට අදාල ආපසු ගෙවීම්

14.9 ප්‍රවේශ පත්‍ර අවභාවිතා කිරීම

14.9.1 අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර තවත් අයෙකුට මාරුකල නොහැකි ය. එම ප්‍රවේශ පත්‍ර භාවිතා කළ යුත්තේ ප්‍රවේශ පත්‍රය හිමි තැනැත්තා විසින් එහි සඳහන් දුම්රිය ස්ථාන දෙක අතර සහ ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් වලංගු කාලය තුල දී පමණකි.

මාරුකල නොහැකි ය

14.9.2 දුම්රිය සාමාන්‍යයාධිකාරීවරයා විසින් හෝ වෙනත් ආකාරයකින් සොයාගත් පරිදි අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍රයක් අවභාවිතා කර ඇතැයි වාර්තා වීම, එම පහසුකම වහාම ආපසු කැඳවීමට හේතුවේ. එවැනි අවස්ථාවක දී දුම්රිය දෙපාර්තමේන්තුවේ රීතී වලට අනුව පැනවිය හැකි දඬුවමකට සහ කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය මඟින් පැනවිය හැකි දඬුවමකට වැඩිමනත් වශයෙන්, සේවකයා විසින් භුක්ති විඳින්නා වූ අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීමේ පහසුකම අවම වශයෙන් එක් වසරක කාලයක් සඳහා තහනම් වීමට ද හේතු වනු ඇත.

අවභාවිතා කිරීමට දඬුවම